**දේශගුණික ඔරොත්තු දීමේ බහු-අදියර වැඩසටහන් ප්‍රවේශ ව්‍යාපෘතිය - 2022**

---

**දේශගුණික ඔරොත්තු දීමේ බහු-අදියර වැඩසටහන් ප්‍රවේශ ව්‍යාපෘතියේ** 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව (IBRD) අතර 2021 සැප්තැම්බර් 17 දින එළඹි අංක 8996- දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ණය ගිවිසුමට අනුව වාරිමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ කාලගුණයේ අධික බලපෑම් සහ ජල විද්‍යාත්මක උපද්‍රව පිළිබඳ අනතුරු ඇඟවීම් වැඩිදියුණු කිරීම සහ දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සඳහා කැලණි ද්‍රෝණියේ බහුකාර්ය ජල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමයි. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ඉහළ බලපෑම් කාලගුණ අනාවැකි සහ පූර්ව අනතුරු ඇඟවීම්, ගංවතුර සහ නායයෑම්, පහළ කැලණි ද්‍රෝණියේ ගංවතුර අවදානම අවම කිරීම, ව්‍යාපෘති කළමනාකරණය සහ හදිසි ප්‍රතිචාර සංරචකය (CERC) යන කොටස් හතර යටතේ ක්‍රියාත්මක වේ. ණය ගිවිසුමට අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 93 ට සමාන රු. මිලියන Rs.18,600ක් වන අතර ඉන් ඇමරිකානු ඩොලර් මිලියන 92 ට සමාන රු. මිලියන 18,400 ක් ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව (IBRD) විසින් මූල්‍යකරණය කිරීමට එකඟ විය. ඉතිරි මුදල රු. මිලියන 200 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යකරණය කිරීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය 2021 ඔක්තෝම්බර් 12 වන දින එහි කටයුතු ආරම්භ කර 2026 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි.

### 1.3 මතය

ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| අංකය | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම/විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| 01 | 2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2023 පෙබරවාරි 28 හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, ව්‍යාපෘතිය මාස 6කට වැඩි ප්‍රමාදයකින් යුතුව | ව්‍යාපෘතියේ අවසන් ගිණුම් මාර්තු මුල් සතියේ අවසන් කර 2023.03.16 දින අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. ඒවා සමාලෝචනය කර සත්‍යාපනය කිරීමට අමාත්‍යාංශයට යම් කාලයක් ගත වූ අතර එය | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කර පෙබරවාරි 28 හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | 2023 සැප්තැම්බර් 13 වැනි දින මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණි. | මෙතරම් දිගු ප්‍රමාදයකට හේතු වී ඇත. ඉදිරියේදී සිදුවන ප්‍රමාදය අවම කර ගැනීමට අවශ්‍ය උපදෙස් අදාළ නිලධාරීන්ට ලබා දී තිබේ. | |
| 02 | 2009 සැප්තැම්බර් 01 දිනැති විගණන කළමනාකරණ චක්‍රලේඛ අංක DMA/2009(2) | පොදු ආකෘති 287 ප්‍රකාර ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාමට අවශ්‍ය නමුත් ව්‍යාපෘතිය මගින් එවැනි ලේඛනයක් පවත්වා නොතිබුණි. | ව්‍යාපෘතියේ ස්ථාවර වත්කම් සඳහා වාර්තා තබා ගැනීමට පොදු 198 ඉන්වෙන්ටරි ලේඛනය භාවිතා කරනු ලැබේ. මෙම ඉන්වෙන්ටරි ලේඛනය ද අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන බැවින්, මෙම ලේඛනයම ව්‍යාපෘතිය විසින් භාවිතා කරන ලදී. කෙසේ වෙතත්, අදාළ නිලධාරීන්ට අංක 287 දරන තොග ලේඛනය හෝ එම ලේඛනයක් භාවිත කරන ලෙස උපදෙස් ලබා දී ඇත. | පොදු 287 ආකෘතියෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |
| 03 | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි, මු.රෙ. 371(2) (ආ) | මාණ්ඩලික නිලධාරියෙකුට "තත්කාර්ය" අතුරු අග්‍රිම ලබා දිය හැකි වුවද, ඉන්ධන සඳහා වන වියදම් පියවා ගැනීම සඳහා මාණ්ඩලික නොවන නිලධාරියෙකුට ලබා දුන් අත්තිකාරම් එකතුව රුපියල් මිලියන 1.5 කි. එසේ ලබා දුන් අත්තිකාරම් පියවීමට පෙර නැවත ලබා දුන් අවස්ථා 38 ක් විය. | ව්‍යාපෘතියට සීමිත කාර්ය මණ්ඩලයක් සිටින අතර ප්‍රවාහන කටයුතු අධීක්ෂණය කිරීමට නිලධාරියෙක් නොමැත. ප්‍රවාහනය අධීක්ෂණය කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකාර සහකාරවරයකු යොදවා ඇති අතර ව්‍යාපෘති වාහන සඳහා ඉන්ධන අත්තිකාරම් ලබාදීම මෙම නිලධාරියා වෙත නිකුත් කර ඇත. තවද, 2022 වසරේ ඇති වූ ඉන්ධන අර්බුදය හේතුවෙන් අත්තිකාරම් පියවීමට පෙර ඉන්ධන අත්තිකාරම් ලබා දීමට සිදු විය. | මු.රෙ. සලකා බැලීමෙන් තොරව තත්කාර්ය අතුරු අග්‍රිම ලබා නොදිය යුතුය. |
| 04 | උපලේඛන 2, ණය ගිවිසුමේ අංක 8996LK හි 1 වගන්තිය | ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන දින සිට මාස තුනකට නොඅඩු කාලයක් තුළ ජාතික ව්‍යාපෘති අධීක්ෂණ කමිටුවක් ව්‍යාපෘතිය විසින් ස්ථාපිත කළ යුතුය. ව්‍යාපෘතිය 2021 ඔක්තෝබර් 12 දින ආරම්භ කර තිබුණද, ඉහත අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කර නොතිබුණි. | වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ 2022 පෙබරවාරි 21 දිනැති අංක CResMPA/PD/NPOC/09 දරන ලිපිය මගින් ජා.ව්‍යා.අ.ක (NPOC) පිහිටුවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාට දැනුම් දී තිබුණි. අවශ්‍ය වූ විට ජා.ව්‍යා.අ.ක (NPOC) විසින් පිහිටුවනු ලැබේ. | ණය ගිවිසුමේ කොන්දේසි අනුව ජාතික ව්‍යාපෘති අධීක්ෂණ කමිටුව ක්‍රියාත්මක විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| 05 | ව්‍යාපෘති ඇගයුම් ලේඛනය | පළමු ප්‍රතිව්‍යුහගත කිරීමේ පත්‍රිකාවෙන් පසුව "ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීමේ ආධාර සහ ආරක්ෂාව ක්‍රියාත්මක කිරීම" යන ව්‍යාපෘති සංරචකය ක්‍රියාත්මක කිරීම සඳහා විකල්ප විසඳුමක් නොමැතිව ඉවත් කර තිබුණි. | ව්‍යාපෘතියට අදාළ ණය ගිවිසුම අත්සන් කිරීමට පෙර, ලෝක බැංකුව විසින් අනුමත කරන ලද PAD හි සඳහන් කර ඇති පරිදි, සංරචක-3 යනු "ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීමේ සහය සහ ආරක්ෂණ ක්‍රියාත්මක කිරීම" සංරචකයයි. නමුත් රටේ පවතින තත්ත්වය මත ව්‍යාපෘති ණය ගිවිසුම් අත්සන් කිරීම ප්‍රමාද වී ඒවා ප්‍රතිව්‍යුහගත කරන ලදි. | ප්‍රතිව්‍යුහගත කිරීමේදී ව්‍යාපෘති සංරචක සහ අදාළ ක්‍රියාකාරකම් කෙරෙහි ඇති බලපෑම සලකා බැලිය යුතුය. |
| 06 | ව්‍යාපෘති ඇගයුම් ලේඛනය | ව්‍යාපෘති ඇගයුම් ලේඛනයේ ඇමුණුම 5 හි 3 වැනි වගන්තියට අනුව ව්‍යාපෘතිය සඳහා අයවැයක් සකස් කළ යුතු වුවද, ව්‍යාපෘතිය සඳහා අයවැයක් සකස් කර නොතිබුණි. | ව්‍යාපෘතිය සඳහා ණය ගිවිසුම අත්සන් කිරීමට පෙර සහ පසුව රජය විවිධ කම්වු පත් කර ව්‍යාපෘතිය දිගටම කරගෙන යනවාද නැද්ද යන්න තීරණය කිරීමට නිර්දේශ ලබා ගන්නා ලදි.<br>මේ නිසා ව්‍යාපෘතිය සඳහා නිශ්චිත අයවැය ඇස්තමේන්තුවක් සකස් කිරීම දුෂ්කර කාර්යයක් විය. අවසානයේදී ව්‍යාපෘතිය නැවත සකස් කර ක්‍රියාත්මක කිරීමට රජය තීරණය කළ අතර 2023 වර්ෂයේදී සංශෝධිත ගිවිසුම් අත්සන් කරන ලදී. ඒ අනුව ව්‍යාපෘති ඇස්තමේන්තුව සකස් කරන ලදී. | ව්‍යාපෘති ඇගයුම් ලේඛනයට අනුව ව්‍යාපෘතිය සඳහා අයවැයක් සැකසීමට කටයුතු කළ යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| සංරචකය | ක්‍රියාකාරිත්වය | 2022 දෙසැම්බර් 31 දිනට<br>අපේක්ෂිත භෞතික කාර්ය සාධනය ප්‍රතිශතය | <br>කාර්ය සාධනය ලබා ඇති ප්‍රතිශතය | ප්‍රමාදය/විගණන නිරීක්ෂණය | ප්‍රමාද වීමට හේතු |
|---|---|---|---|---|---|
| සංරචක-01 කාලගුණය, ගංවතුර වල අධික බලපෑම් සහ නායයෑම් පිළිබඳ පුරෝකථනය කිරීම සහ පූර්ව අනතුරු ඇඟවීම. | | 5.87% | 4.00% | අනුමත ක්‍රියාකාරී සැලැස්මට අනුව අපේක්ෂිත කාර්ය සාධනය ලබා ගැනීමට ව්‍යාපෘතිය අසමත් වී තිබුණි. | |
| සංරචක - 02 පහළ කැලණි ද්‍රෝණියේ ගංවතුර අවදානම අවම කිරීමේ ආයෝජනය | 2.1 අඹතලේ ලවණතා බාධක සහ ගංවතුර සහ නායයෑම් අවම කිරීම සඳහා සූදානම් කිරීමේ අධ්‍යයනය | 11.96% | 4.00% | අනුමත ක්‍රියාකාරී සැලැස්මට අනුව අපේක්ෂිත කාර්ය සාධනය ලබා ගැනීමට ව්‍යාපෘතිය අසමත් විය. | ව්‍යාපෘති මෙහෙයුම් ඒකක සහ ක්‍රියාත්මක කිරීමේ ඒකක වල පාලනයෙන් ඔබ්බට ගිය සාධක හේතුවෙන් ව්‍යාපෘතිය 2022 දී මන්දගාමී ප්‍රගතියක් ඇතිවිය<br><br>ව්‍යාපෘති කළමනාකරණ ඒකකය පිහිටුවීම සහ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම ප්‍රමාද වීම.<br><br>ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා කමිටු පත් කිරීම.<br><br>නව ගොඩනැගිලි ඉදිකිරීම සහ විදේශීය විශේෂඥයින් බඳවා ගැනීම අත්හිටුවීම. |
| | 2.2 වී ඔය ජලාශයේ සවිස්තරාත්මක සැලසුම්, ලංසු තැබීමේ ලේඛන, නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම (RAP)පාරිසරික බලපෑම් තක්සේරුව (EIA)(ඇ.ඩො. මිලියන 6) | 12.70% | 5.00% | අනුමත ක්‍රියාකාරී සැලැස්මට අනුව අපේක්ෂිත කාර්ය සාධනය ලබා ගැනීමට ව්‍යාපෘතිය අසමත් විය. | |
| | 2.3 ඉහළ දැරණියගල ජලාශය සඳහා ශක්‍යතා අධ්‍යයනය සහ සවිස්තරාත්මක සැලසුම්, RAP සහ EIA, ලංසු ලේඛන වෙනත් අධ්‍යයන (ඇ.ඩො. මිලියන 7) | 5.53% | 0.00% | එම කාලය තුළ කිසිදු ක්‍රියාකාරකමක් ආරම්භ කර නොතිබුණි. | |
| | 2.4 කැලණි ද්‍රෝණියේ සිට වියළන ගංගා ද්‍රෝණි හ දක්වා ද්‍රෝණි හැරවීම් සඳහා පූර්ව ශක්‍යතා සහ ශක්‍යතා අධ්‍යයනය (ඇමරිකානු ඩොලර් මිලියන 1) | 26.5% | 0.00% | එම කාලය තුළ කිසිදු ක්‍රියාකාරකමක් ආරම්භ කර නොතිබුණි. | |
| | 2.5 පහළ කැලණි ද්‍රෝණියේ ගංවතුර ආරක්ෂණ කටයුතු පිළිබඳ සවිස්තරාත්මක ඉංජිනේරු සැලසුම් (ඇමරිකානු ඩොලර් මිලියන 5) | 9.50% | 0.00% | එම කාලය තුළ කිසිදු ක්‍රියාකාරකමක් ආරම්භ කර නොතිබුණි. | |

| | |
|---|---|
| කළමනාකාරීත්වයේ ප්‍රතිචාරය | ව්‍යාපෘති මෙහෙයුම් ඒකක සහ ක්‍රියාත්මක කිරීමේ ඒකක වල පාලනයෙන් ඔබ්බට ගිය සාධක හේතුවෙන් CResMPA ව්‍යාපෘතිය 2022 දී මන්දගාමී ප්‍රගතියක් අත්විඳින ලදී. ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය පිහිටුවීම 2022 පෙබරවාරි දක්වා ප්‍රමාද වූ අතර අනුමත නිලධාරීන් බඳවා ගැනීම 2022 පෙබරවාරි සිට ජූලි දක්වා සිදු විය. රජයේ ප්‍රතිපත්තිමය තීරණ නිසා කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීම වැළැක්වී තිබුණ අතර එමඟින් සැලසුම් කළ ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද විය.<br><br>ආර්ථික අර්බුද සහ සමාජ අවිනිශ්චිතභාවය මධ්‍යයේ ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්ම තීරණය කිරීම සඳහා රජය විසින් කමිටු පත් කරන ලද අතර, ඇතැම් ක්‍රියාකාරකම් ඉවත් කිරීම සහ අනෙක් ඒවා පසුකාලීන අදියර වෙත මාරු කිරීම මගින් ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගත කිරීමකට මග පාදන ලදී.<br><br>රජය විසින් නව ගොඩනැගිලි ඉදිකිරීම සහ විදේශ විශේෂඥයින් බඳවා ගැනීම නවතා දමා ඇති අතර, ජාතික කාලගුණ අනාවැකි සහ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සඳහා වූ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය අත්හැර දමා, අදියර-I බෙදා හැරීමට සහ අදියර-2 වෙත මාරු වීමට හේතු විය.<br><br>විශේෂඥයින් බඳවා ගැනීම අත්හිටුවීම අඹතලේ ජල පවිත්‍රාගාරය අසල ලවණතා බාධකයක් ඉදිකිරීම සඳහා විදේශීය විශේෂඥ කණ්ඩායමක් බඳවා ගැනීම ප්‍රමාද වීමට හේතු වූ අතර වී ඔය ජලාශයේ සවිස්තරාත්මක ඉංජිනේරු සැලසුම් සැකසීමට එය දැඩි ලෙස බලපෑවේය. ඉහළ දැරණියගල ජලාශය ඉදිකිරීමේ ශක්‍යතා අධ්‍යයනය, කැලණි ගඟේ ජලය වෙනත් ගංගා ද්‍රෝණිවලට හැරවීමේ හැකියාව සොයා බැලීමේ පූර්ව ශක්‍යතා අධ්‍යයනය සහ පහළ . කැලණි ගං ද්‍රෝණියේ ගංවතුර පාලන වේලි ඉදිකිරීම සඳහා සවිස්තරාත්මක ඉංජිනේරු සැලසුම් සකස් කිරීම තාවකාලිකව නවතා ව්‍යාපෘතියේ II අදියර වෙත ගෙන යන ලදී.<br><br>වාරිමාර්ග අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය සහ ලෝක බැංකුව එක්ව දිස්ත්‍රික්ක 25 ක හදිසි පුනරුත්ථාපන කටයුතු සිදු කිරීම සඳහා ව්‍යාපෘති සංරචක 1 සහ 2 වෙතින් ඩොලර් මිලියන 15 ක් ප්‍රතිස්ථාපනය කිරීමට හැකි විය. ව්‍යාපෘතියේ ප්‍රතිව්‍යුහගත කිරීම මේ වන විට අවසන් කර ඇත. |
| විගණකගේ නිර්දේශ | ප්‍රතිව්‍යුහගත කිරීම අනුව සැලසුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර සැලසුම් කළ පරිදි එක් එක් සංරචක යටතේ සියලුම ව්‍යාපෘති ක්‍රියාකාරකම් සම්පූර්ණ කළ යුතුය. |

## 3.2 ව්‍යාපෘති අරමුණු වලින් බැහැරව සිදු කරන ලද අමතර ක්‍රියාකාරකම්/ගෙවීම්

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අසහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 01 | මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සංරචකය 02 යටතේ අඹතලේ ලවණතා බාධක ඉදිකිරීම් සහ සූදානම් කිරීමේ අධ්‍යයන සඳහා රුපියල් මිලියන 5 ක මුදලක් වැය කර ඇත.<br><br>මෙම වියදම් ඉන්ධන වියදම් ප්‍රතිපූරණය කිරීම සඳහා දරන ලද බවත් 2 සංරචකය යටතේ එම ක්‍රියාකාරකම සඳහා ඉන්ධන වියදම් සඳහා සුදුසුකම් තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබූ බවත් නිරීක්ෂණය විය.<br><br>ඉහත වවුචරවල අමුණා ඇති බිල්පත්වල විස්තර අනුව රාජාංගනය, හුරුළුවැව සහ අනුරාධපුර ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල විසින් පිළිවෙළින් 476L, | ශ්‍රී ලංකාවේ ආර්ථික අභියෝග හේතුවෙන් මෙම ව්‍යාපෘතිය නැවත අනුමත කර ගන්නා ලදී. අනුමත ඩොලර් මිලියන 92 න් ඩොලර් මිලියන 15ක් වෙන් කළේ ජනතාවට සෘජුවම සෙත සැලසෙන කටයුතු සඳහායි. සියලුම දිස්ත්‍රික්ක හරහා වාරිමාර්ග අංශයේ වැව්, ඇළ වේලි සහ වේලි ප්‍රතිසංස්කරණය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය. 2022 වසරේදී මෙම ඇස්තමේන්තු සකස් කිරීමට පෙර දිස්ත්‍රික් නිලධාරීන්ට ක්ෂේත්‍රයට ගොස් ව්‍යාපෘති ස්ථාන පරීක්ෂා කිරීමට සිදු වූ අතර ඒ සඳහා භාවිත කරන වාහන සඳහා ව්‍යාපෘතිය මඟින් ඉන්ධන ලබා දෙන ලදී. මේ ආකාරයට, ඉන්ධන සඳහා වැය වූ මුදල් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා වෙන් කරන ලද සංරචක-02 යටතේ ගිණුම්ගත කරන ලදී.<br>ව්‍යාපෘති ප්‍රතිපාදන ලබාදීමේ ප්‍රමාදය | ක්‍රියාත්මක කරන ආයතනයට ඉංජිනේරු සහ පරිපාලන කටයුතු සහ ගිණුම්කරණ ක්‍රියාවලිය සිදු කිරීම සඳහා නිසි මාර්ගෝපදේශ නිකුත් කළ යුතුය.<br><br>ව්‍යාපෘති වියදම් විනිවිදභාවයෙන් යුතුව සිදුකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 450L සහ 500L තොග වශයෙන් ඩීසල් තොග මිල දී ගෙන ඇති බවත්, ඒ සඳහා භාවිත කළ ඉන්ධන තොගය පිළිබඳ කිසිදු තොරතුරක් නොමැති බවත් අනාවරණය විය. | හේතුවෙන් ඇතැම් ප්‍රාදේශීය කාර්යාල ඉන්ධන සඳහා දෙපාර්තමේන්තු මුදල් යොදවා ඇත. මෙලෙස භාවිතා කරන ඉන්ධන ලීටර් ගණන සලකා බලා, එම ලීටර් ප්‍රමාණයම තොග වශයෙන් වසර තුළ මිලදී ගැනීමට ඔවුන් කටයුතු කර ඇත. | |
| 02 | ඉන්ධන වියදම් රු. 136,120 ක් CResMPA ව්‍යාපෘතියට අදාළ නොවන ක්‍රියාකාරකමක් වූ උමා ඔය ක්ෂේත්‍ර සංචාරයට අදාළව වියදම් කර තිබුණි. | උමාඔය ජලාශ ව්‍යාපෘතිය අමාත්‍යාංශය යටතේ ඇති ජලාශ දෙකක් ඉදිකළ, විශාල සමාජ ගැටලු රැසකට මුහුණ දුන්, දැනට එහි අවසන් අදියරේ පවතින ව්‍යාපෘතියකි. ජලාශ ඉදිකිරීමේදී උමා ඔය ව්‍යාපෘතියේ නිලධාරීන් මුහුණ දෙන අභියෝග, ඒවාට ලබා දී ඇති විසඳුම් යනාදිය පිළිබඳ අත්දැකීම් හුවමාරු කර ගැනීම සඳහා CResMPA නිලධාරීන් වෙනුවෙන් ක්ෂේත්‍ර චාරිකාව සංවිධානය කර තිබුණි. | විනිවිද භාවයෙන් යුතුව සැලසුම් කරන ලද කටයුතු සඳහා පමණක් වියදම් කළ යුතුය. |

**3.3 නිෂ්ක්‍රිය/ භාවිත නොකළ/ ඌන උපයෝජිත සම්පත්**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 01 | 2022 මාර්තු 31 වැනි දින ව්‍යාපෘතිය ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුවෙන් (IBRD) රු. මිලියන 173 ක මුදලක් ලැබී තිබුණද, වර්ෂය තුළ වැය කර තිබුණේ රු. මිලියන 29.4 ක් පමණි. එහි ප්‍රතිඵලයක් ලෙස රු. මිලියන 160 ක මුදලක් භාවිත නොකර ගිණුමේ නිෂ්ක්‍රියව තැන්පත් කර තිබුණි. | විවිධ හේතූන් මත ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීම ප්‍රමාද විය. මුලින් සැලසුම් කළ පරිදි මාස 06 කට අවශ්‍ය මුදල ලෙස ඇමෙරිකානු ඩොලර් මිලියන 0.58 ක් ලෝක බැංකුවෙන් ලැබිණි. ඉහත සඳහන් කළ පරිදි ව්‍යාපෘති කටයුතු සිදු නොවූ අතර, වර්ෂය තුළ වැය කර ඇත්තේ රු. 29,385,719 ක මුදලක් පමණි. | ව්‍යාපෘතිය සඳහා ලබා දෙන අරමුදල් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ආර්ථික වශයෙන් ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා යෙදවිය යුතුය. |
| 02 | 2022 වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තුව යටතේ රු. මිලියන 1,500 ක් වෙන් කර තිබුණද, භාවිත කර තිබුණේ රු. මිලියන 76.72 (ප්‍රතිපාදනවලින් 5.11%) පමණි. සමාලෝචිත වර්ෂය තුළ ප්‍රතිපාදනවලින් 94.89% ක ප්‍රතිශතයක් භාවිත කර නොතිබුණි. ව්‍යාපෘති ඇගයුම් ලේඛනයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව 2021 - 2026 කාල සීමාව තුළ ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කිරීමට නොහැකි වනු ඇති බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය පිහිටුවීම 2022 පෙබරවාරි දක්වා ප්‍රමාද වූ අතර අනුමත නිලධාරීන් බඳවා ගැනීම 2022 පෙබරවාරි සිට ජූලි දක්වා සිදු විය. රජයේ ප්‍රතිපත්තිමය තීරණ නිසා කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීම වැළැක්වූ අතර එමඟින් සැලසුම් කළ ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද විය. | ව්‍යාපෘති කාල සීමාව තුළ ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ ගැටළු

ව්‍යාපෘති ණය ගිවිසුමේ 2 වන උපලේඛනයේ 01, A.2 වගන්තියට අනුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය සඳහා වගකිව යුතු සුදුසුකම් සහ පළපුරුද්ද සමග ප්‍රමාණවත් වෘත්තීය සහ පරිපාලන කාර්ය මණ්ඩලයක් සහිත ව්‍යාපෘති සම්බන්ධීකරණ කණ්ඩායමක් බැංකුවේ කොන්දේසි යටතේ,ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන දින සිට මාස 2 ක් ඇතුළත ස්ථාපිත කළ යුතුය.
කෙසේ වෙතත්, 2022 දෙසැම්බර් 15 වැනි දින විගණනය කරන ලද දිනය වන 2023 ජූනි 26 දින දක්වා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සම්පූර්ණ කාර්ය මණ්ඩලය ව්‍යාපෘතිය සඳහා බඳවා ගෙන නොතිබුණි.

| තනතුරු ගණන | | | | කළමනාකාරීත්වයේ අසහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| අනුමත සේවක තනතුර | අනුමත | 2022 දෙසැම්බර් 31 දිනට සත්‍ය | පුරප්පාඩු සංඛ්‍යාව | | |
| 1. ජ්‍යේෂ්ඨ ඉංජිනේරු-ප්‍රසම්පාදන | 01 | 00 | 01 | රජයේ ප්‍රතිපත්තිමය තීරණ නිසා කාර්ය මණ්ඩල අඩු කිරීම සහ බඳවා ගැනීම් නවතා දැමීම නිසා ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර පුරප්පාඩු වී ඇත. ඉහත ප්‍රතිපත්තිමය තීරණ හේතුවෙන් පත්වීම් ලබාදීමේ දී අමාත්‍යාංශය, දුෂ්කරතාවන්ට මුහුණ දී ඇත. රජයේ උපදෙස් අනුව මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන බව අමාත්‍යාංශය ප්‍රකාශ කර ඇත. | රජයේ චක්‍රලේඛ, රීති සහ රෙගුලාසිවලට අනුව අවම කාර්ය මණ්ඩලයක් පවත්වා ගනිමින් ව්‍යාපෘතියේ කටයුතු කාර්යක්ෂමව සිදු කිරීමට උත්සාහ කළ යුතුය. |
| 2. සන්නිවේදන නිලධාරි | 01 | 00 | 01 | | |
| 3. සමාජ හා පරිසර නිලධාරි | 01 | 00 | 01 | | |
| 4. රියදුරු | 04 | 03 | 01 | | |

## 3.5 පද්ධති හා පාලන

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අසහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 01 | ව්‍යාපෘති ඇගයුම් ලේඛනයේ 05 වන ඇමුණුමේ, 5 වැනි වගන්තියට අනුව, එක් එක් ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා වෙන වෙනම ගිණුම් පොත් පවත්වාගෙන යා යුතුය. රජයේ අරමුදල් සහ විදේශ අරමුදල් මගින් දරන ලද සංරචක තුනක් යටතේ විවිධ ක්‍රියාකාරකම්වල වියදම් සඳහා ව්‍යාපෘතිය උප ලෙජර ගිණුම් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ව්‍යාපෘති පරිපාලන ලේඛණයේ හි ඇමුණුම 05 ට අනුව, ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය විසින් ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා වෙනම ගිණුම් පොත් පවත්වාගෙන යයි. සියලුම ලෙජර ගිණුම් MS Excel මෘදුකාංගය භාවිතයෙන් පවත්වාගෙන යන අතර ඒවායේ දෘඩ පිටපත් විගණනය සඳහා ඉදිරිපත් කරන ලදී. සියලුම වියදම් සංරචක අනුව, අවසාන ගිණුමේ වෙන වෙනම ඉදිරිපත් කරන ලදී. කෙසේ වෙතත්, 2023 වර්ෂයේදී, ව්‍යාපෘතිය සඳහා පරිගණකගත ගිණුම්කරණ පද්ධතියක් ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව ඉදිරි වසරේ අවසන් ගිණුම් වලින් සවිස්තරාත්මක ලෙජර් ගිණුම් ඉදිරිපත් කෙරේ. | ව්‍යාපෘති ඇගයුම් ලේඛනයට අනුව, එක් එක් ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා වෙන වෙනම ගිණුම් පොත් පවත්වාගෙන යා යුතුය. GOSL අරමුදල් සහ විදේශීය අරමුදල් මගින් දරනු ලබන සංරචක තුනක් යටතේ විවිධ ක්‍රියාකාරකම්වල වියදම් සඳහා උප ලෙජර ගිණුම් පවත්වාගෙන යා යුතුය. |

| | | | |
|---|---|---|---|
| 02 | ව්‍යාපෘති ඇගයුම් ලේඛනයේ ඇමුණුම 5 හි 13 වැනි වගන්තියට අනුව, අයවැය වර්ගීකරණය මගින් වියදම් වාර්තා උත්පාදනය කිරීමට පහසුකම් සලසන ගිණුම් පද්ධතියක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය පවත්වාගෙන යා යුතු අතර එමගින් අයවැය සමඟ සංසන්දනය කිරීමට සහ වියදම් ඵලදායී ලෙස අධීක්ෂණය කිරීමට හැකි වේ. ව්‍යාපෘතිය සඳහා එවැනි ගිණුම්කරණ සහ අධීක්ෂණ පද්ධතියක් ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය මගින් පවත්වාගෙන ගොස් නොතිබුණි. | උපදේශන ප්‍රසම්පාදන කමිටුවක් පත්කිරීමේ අවිනිශ්චිතතාවය හේතුවෙන් ව්‍යාපෘතියේ පරිගණකගත ගිණුම්කරණ පද්ධතියක් ලබා ගැනීමට ප්‍රමාද විය. දැනට, කළමනාකරණ තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු උපදේශන සමාගමක් තෝරා ගැනීම සඳහා ඇගයීම් කටයුතු සිදු වෙමින් පවතී. | මනා මූල්‍ය කළමනාකරණයක් සහතික කිරීම සඳහා ව්‍යාපෘතිය මගින් ගිණුම්කරණ පද්ධතියක් පවත්වාගෙන යා යුතුය. |
| 03 | උපලේඛන 2, ණය ගිවිසුමේ 1 වන වගන්තියට අනුව, ක්‍රියාත්මක වන දින සිට මාස හයකට නොඅඩු කාලයකට පසුව, බැංකුවට පිළිගත හැකි මෙහෙයුම් මූල්‍ය කළමනාකරණ මෘදුකාංගය සකස් කර නොතිබුණි. කෙසේ වෙතත්, CRIP ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 7.4 ක වියදමින් මිලදී ගත් ගිණුම්කරණ මෘදුකාංගය භාවිත කිරීමේ හැකියාව පරීක්ෂා කිරීමට ව්‍යාපෘතිය අවධානය යොමු කර නොතිබුණි. | CRIP ව්‍යාපෘතිය සඳහා ගිණුම්කරණ පද්ධතියක් සහිත කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) රු. මිලියන 7.4 ක වියදමින් මිලදී ගන්නා ලදී. CRIP ව්‍යාපෘතියේ නිර්ණායක මත පදනම්ව මෙම MIS සංවර්ධනය කරන ලදී. CRIP ව්‍යාපෘතියේ රු. මිලියන 23,875 ගනුදෙනු සහ කොන්ත්‍රාත් පැකේජ 800 ක පමණ තොරතුරු මෙම දත්ත පද්ධතියට ඇතුළත් කර අදාළ වාර්තා සකස් කර ක්‍රියාකාරකම් ඉක්මනින් හා පහසුවෙන් නිරීක්ෂණය කරන ලදී.<br>CRIP ව්‍යාපෘතියේ සමහර ක්‍රියාකාරකම් CResMPA ව්‍යාපෘතිය මගින් සිදු කරනු ලැබේ, නමුත් මෙම අදියර තුනක වැඩසටහනක් වෙනස් අරමුණු සහ නිර්ණායක මත පදනම් වේ. ඉඩම් අත්පත් කර ගැනීම්, වන්දි ගෙවීම්, ක්ෂේත්‍රයෙන් වන්දි ප්‍රතිලාභීන්ගේ තොරතුරු ඇතුළත් කිරීම, GIS මෘදුකාංග භාවිතයෙන් අධීක්ෂණය වැනි සංකීර්ණ කාර්යයන් රැසක් CResMPA ව්‍යාපෘතියේ කළමනාකරණ තොරතුරු පද්ධතිය මගින් සිදු කිරීමට අවශ්‍ය වේ. | ව්‍යාපෘතිය ණය ගිවිසුමට අනුකූල විය යුතු අතර මෙහෙයුම් මූල්‍ය කළමනාකරණ මෘදුකාංගය ක්‍රියාත්මක කළ යුතුය. තවද, අවශ්‍ය යාවත්කාලීන සමඟ CRIP ව්‍යාපෘතිය සඳහා මිල දී ගත් ගිණුම්කරණ මෘදුකාංගය භාවිතා කළ යුතුය. |
| 04 | 2022 වසර සඳහා මූලික ඇස්තමේන්තුවට අනුව ව්‍යාපෘතියේ කොටස් තුනක් යටතේ රු. මිලියන 1,500 ක් වෙන් කර තිබුණි. මූල්‍ය ප්‍රකාශය සමඟ ඉදිරිපත් කරන ලද ඇමුණුම 2, අයවැයට එරෙහි වියදම් අනුව, මූලික ඇස්තමේන්තුව රු. මිලියන 570 ක් ලෙස වෙනස් කර ඇත. | වසර ආරම්භයේදී අයවැය ඇස්තමේන්තු මගින් ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 1,500 ක් වෙන් කරන ලදී.<br>කෙසේ වෙතත්, උප ව්‍යාපෘති ආරම්භ කිරීම ප්‍රමාද වීම සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රජය නිශ්චිත තීරණයක් නොගැනීම හේතුවෙන් වෙන් කළ ප්‍රතිපාදන | ඇස්තමේන්තු වෙනස් කිරීමෙන් පසු ළඟම ඇති ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීමේදී සංශෝධිත ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කෙසේ වෙතත් ඉහත වෙනස්කම් සඳහා නිසි අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සැලසුම් කළ පරිදි ප්‍රයෝජනයට ගැනීමට නොහැකි විය. අමාත්‍යාංශය සමඟ පැවති සාකච්ඡාවලින් අනතුරුව වාරිමාර්ග අමාත්‍යාංශයේ අනෙකුත් ව්‍යාපෘති සඳහා රු. මිලියන 930 ක මුදලක් ලබාදීමට එකඟ විය. අංක 2022-1980000-BCUV-00000027 දරන මාරු ලිපියේ දක්වා ඇති පරිදි අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ඇතිව මෙම මාරුව සිදු කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ව්‍යාපෘතිය සඳහා වාර්ෂික ඇස්තමේන්තු මුදල රු. මිලියන 570 දක්වා අඩු වූ අතර, ඒ අනුව වියදම් වාර්තා කර ඇත. | |
| 05 | ක්‍රියාකාරී සැලැස්මට අනුව, ව්‍යාපෘති සංරචක-3 සඳහා සමාලෝචිත වර්ෂය අවසානයේ අපේක්ෂිත භෞතික කාර්ය සාධනය, ව්‍යාපෘති කළමනාකරණය සියයට 2.97 ක් වූ අතර සත්‍ය කාර්ය සාධනය සියයට 14 ක් විය. එබැවින් ව්‍යාපෘති කළමනාකරණය සඳහා වෙන් කළ මුදලින් 5 වරක් ව්‍යාපෘතිය සඳහා වැය කර ඇත. | 2022 වැඩ සැලැස්මේ නොතිබූ ලෝක බැංකුව සැලසුම් නොකළ ඉදිරි පෙළ ගෙවීම් සඳහා ව්‍යාපෘති අරමුදල් යොදා ගැනුණි. අනෙකුත් වියදම් වැඩ සැලැස්මට අනුකූල වන අතර වැටුප් හා වාහන නඩත්තු පිරිවැයට අමතරව MASL පරිශ්‍රයේ PCT කාර්යාලය, පවත්වා ගැනීමට අවශ්‍ය ආරක්ෂක සේවා, විදුලිය සහ සනීපාරක්ෂක සේවා යන වියදම් සඳහා වන ගෙවීම් වේ. | ව්‍යාපෘති කළමනාකරණ පිරිවැය ඇස්තමේන්තු යටතේ තබා ගත යුතුය. |
| 06 | 2022 වර්ෂය සඳහා රු. මිලියන 71.05 ක් හෙවත් මුළු ව්‍යාපෘති පිරිවැයෙන් සියයට 92.6 ක් වැටුප්, දීමනා සහ අනෙකුත් කටයුතු සඳහා වැය කර තිබුණද ව්‍යාපෘති සැලැස්මට අනුව කිසිදු ව්‍යාපෘති කටයුත්තක් ආරම්භ කර නොතිබුණි. | ව්‍යාපෘතිය දැනට සීමිත කාර්ය මණ්ඩලයක් මඟින් ක්‍රියාත්මක වන අතර, ඔවුන්ගේ වැටුප් සහ දීමනා අදාළ නීති රීතිවලට අනුකූලව ගෙවනු ලැබේ. තවද, ව්‍යාපෘති ආරම්භක අදියරේදී පරිපාලන හා මෙහෙයුම් වියදම් සඳහා වැඩි ප්‍රතිශතයක මුදල් වෙන් කිරීම සාමාන්‍ය සිරිතකි. ව්‍යාපෘතියේ මුල් අදියරේදී මූලික වශයෙන් අවධානය යොමු වන්නේ පූර්ණ පරිමාණ සංවර්ධන කටයුතුවලට වඩා අත්‍යාවශ්‍ය සූදානම් කිරීමේ කටයුතු කෙරෙහිය. ව්‍යාපෘතියේ ප්‍රගතිය සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් කඩිනම් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කෙරේ. | |